01. හැඳින්වීම

රටක සංවර්ධනයට වැදගත් වන්නාවූ යටිතල පහසුකම් අතුරින් මාර්ග සංවර්ධනය ඉතා සුවිශේෂ ස්ථානයක් ගනී. මුහුදුබඩ මාර්ගය (A002) ඔස්සේ කොළඹ සිට මාතර දක්වා වූ කි.මී. 160 ක දුර ප්‍රමාණයකින් යුත් පැය 5 කට අධික ධාවන කාලයක් ගතවන අධික තදබදයකින් යුත් මාර්ගය වෙනුවට අලුතින් නිමවූ කි.මී. 126 ක් පමණ දුර ප්‍රමාණයකින් යුත් දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි ධාවනය කිරීමට ගතවන කාලය පැය 1 1/2 කි. පළමු අදියරේ දී මහජනතාවට විවෘත වන්නේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට පින්නදූව දක්වා වූ කි.මී 95.3 ක කොටස හා කි.මී 5.2 ක් වන පින්නදූව සිට ගාල්ල දක්වා වන ගාලු වරාය ප්‍රවේශ මාර්ගය (B594) පමණි.

මෙම අධිවේගී මාර්ගයෙහි ගමන් කිරීම මගී ජනතාවට ඉමහත් පහසුවක් බව නොකිවමනාය. සියලුම වාහන ඒකාකාරී වේග රටාවක් තුළ ධාවනය වීම හේතුවෙන් ඉන්ධන පිරිමැස්ම ද, ටයර් සහ තිරිංග ක්ෂයවීම් අඩුවීම ද වාහන හිමිකරුවන්ට මහත් අස්වැසිල්ලක් ගෙන දෙයි. බාධාවන්ගෙන් තොරව ධාවනය කිරීමට හැකිවීම තුළ රියදුරන්ගේ ආතතිය මෙන්ම මහන්සිය ද අඩුවේ. විරුද්ධ දිශාවන්ට බාධාවකින් තොරව ධාවනය කිරීමට පහසුවන පරිදි අධිවේගී මාර්ගය හරි මැදින් වෙන්කර තිබීම, ත්‍රීරෝද රථ, බයිසිකල්, ට්‍රැක්ටර් ආදී සෙමින් ධාවනය වන වාහන ධාවනයට ඉඩනොදීම, අධික බර පැටවූ වාහන වලට ඇතුළුවීමට ඉඩනොදීම මෙන්ම පදිකයින්ට ගමන් කිරීමට අවසර නොදීම යන කරුණු මෙම මාර්ගයේ වේගවත් ආරක්ෂාකාරී ධාවනය තහවුරු කරයි.